**ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා රු.53,400 ක් හා 2023 වර්ෂ වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශණ සැකසීමේ දී ආරම්භක ශේෂයන්ට ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව රු.317,200 ක් වටිනා ජල මීටර් 40 ක අගය අඩුවෙන් හා රු.26,250 ක් වටිනා 30w LED බල්බ් 07 ක වටිනාකම වැඩියෙන්ද ගිණුමට ගෙන තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශණ සැකසීමේ දී ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| (ඇ) | පාවිච්චි කර ආපසු භාරදී තිබූ ඒකක වටිනාකම රු.7,910 ක් වූ ජල මීටර් 88 ක වටිනාකම රු.696,080 ක් ගිණුමට ගෙන නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | ගෝමරන්කඩවල හා මැදවච්චිය ජල යෝජනා ක්‍රම දෙකට අදාළව ජල සැපයුම් ලබාදීමේදී අයකරගත යුතුව තිබූ රු.1,786,479 ක් මීටර් ගාස්තු වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) ඉඩම් හා ගොඩනැගිලි | 121,412,631 | අයිතිය තහවුරු වන ලියවිලි හා ස්ථාවර වත්කම් ලේඛන | ඉදිරියේ දී මෙම සියළු ලේඛණ පිළියෙළ කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) යන්ත්‍ර උපකරණ | 5,471,080 | ස්ථාවර වත්කම් ලේඛන | - එම - | - එම - |
| (ඇ) පරිගණක උපාංග | 3,310,131 | ස්ථාවර වත්කම් ලේඛන | - එම - | - එම - |
| (ඇ) ගබඩා තොගය | 2,444,734 | තොග ආගණන වාර්තා, ගබඩා ලේඛන | - එම - | - එම - |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | | |
| (i) | 24 වගන්තිය | සභාව විසින් ඉදිකර ඇති මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර එම මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | බල ප්‍රදේශය තුල පවතින සියලුම මාර්ග පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 126 වගන්තිය | සභාව තුළ ආදායම් උත්පාදනය කළ හැකි පරිදි අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණි. | අප බල ප්‍රදේශය තුල ඇති ආදායම් උත්පාදනය කරගත හැකි මාර්ග සම්බන්ධයෙන් සොයා බලා ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව | ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 134 වගන්තිය | බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු කර නොතිබුණි. | අප බල ප්‍රදේශය තුල ඇති දියුණු ප්‍රදේශයක් වශයෙන් ගෝමරන්කඩවල ග්‍රාම නිලධාරි වසම තුල පවතින නිශ්චිත භූමි පෙදෙසක් මේ වන විට හඳුනාගනු ලැබ ඇති බව | ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (iv) | 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.11,160,905 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථිර ආදායම් පරීක්ෂකවරයෙකුගේ හිඟය හේතුවෙන් පසුගිය වසර වල ආදායම් එක් රැස් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි අයුරින් සිදු නොවුන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | විගණන පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතී මාලාව | | | |
| | (i) 193 වැනි රීතිය | අයවැයගත මූල්‍ය ප්‍රකාශන පරිපූර්ණ සම්මත සමඟ සසඳා බලන කල එක් එක් ආදායම් විෂයයන් සහ වියදම් විෂයයන් යටතේ ඇති වූ ඌණතාවයන්/ අතිරික්තතාවයන් පිළිබඳ ප්‍රකාශයන් කරුණු පැහැදිලි කිරීමද සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රාදේශීය සභා මූල්‍ය රීතී ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 218 වැනි රීතිය | පිරිවැය රු.71,084,473 ක ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් තක්සේරු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රාදේශීය සභා මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| | මුදල් රෙගුලාසි 138 | සියළුම ගෙවීම් නිසි බලධරයෙකු විසින් සහතික කළ යුතු වුවත් අවස්ථා 06 කදී කරන ලද රු.715,460 ක් වටිනා ගෙවීම් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | විගණනය විසින් පෙන්වා දී තිබූ අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 02/2018 චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරනු ලබන බව | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 02/2018 චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | අධිකරණ අමත්‍යාංශයේ ලේකම්ගේ අංක 04/1994 හා 1994 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය | සෑම මාණ්ඩලික නිලධාරියෙකු විසින් වාර්ෂිකව තම වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දී ඇති උපදෙස් අනුව කටයුතු කිරීමට එකඟ වන බව | දිනැති චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.2,510,982 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.225,135 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ව්‍යාපාර හා බදු කුලී | 600 | 381 | 381 | - | 450 | 74 | 164 | - |
| කුලී | 1,000 | 924 | 842 | 407 | 4,133 | 627 | 475 | 325 |
| ජල ගාස්තු | 120 | 1,166 | 712 | 1,346 | 800 | 1,043 | 144 | 892 |
| වෙනත් ආදායම් | 200 | 329 | 149 | 330 | 638 | 1,324 | 2,252 | 150 |
| එකතුව | **1,920** | **2,800** | **2,084** | **2,083** | **6,021** | **3,068** | **3,035** | **1,367** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසර ගණනාවක සිට පැවත එන ජල සැපයුම් ලබා දීමේදී අයකරගත යුතු මීටර් ගාස්තු වූ රු.17,864,790 ක් හා හිඟ ජලගාස්තු වශයෙන් වූ රු.1,346,234 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සභාව විසින් බලප්‍රදේශයේ ධාවනය වන ත්‍රීවිල් රථ නියාමනය කිරීම සඳහා රීතී සකස් කර ඒ මත ලබාගත යුතු ගාස්තු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | බල ප්‍රදේශය තුළ පවතින ආදායම් මාර්ග නියාමනය කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | බල ප්‍රදේශයට ගැළපෙන අතුරු ව්‍යවස්ථා පනවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි මේ වන විට අවධානය යොමුකර ඇති බව | විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සභාවක කාර්යයන් අතර ප්‍රධාන කාර්යයක් ලෙසට බල ප්‍රදේශය තුළ සිදු කරන ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කිරීම සිදු කළ යුතු වුවද, 2020 වර්ෂය වෙනුවෙන් ඉල්ලුම් පත්‍ර 03 ක් ලැබී තිබූ අතර ඉතිරි වර්ෂ වෙනුවෙන් අයදුම්පත් කිසිවක් ලැබී නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව | ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කළ යුතුය. |
| (ඇ) සභාව සතුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නිසි සැලසුමක් නොවූ අතර සභා බල ප්‍රදේශයේ එක්රැස්වන කසල වෙන් කිරීමකින් තොරව රැස්කර එම කසල වනජීවී කලාපයක් වන කිඹුල් මැටියාව, ගෝරමන්කඩවල යන ස්ථානයට බැහැර කර තිබුණි. | ඉදිරියේදී සැලසුමකට අනුව කටයුතු කරන බව | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 3.9.1 දරන ප්‍රසම්පදාන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ඉදිකිරීම් සමිතිවල මූල්‍ය තත්ත්වය සම්බන්ධ ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා කර බලා තෝරා ගැනීමත් කළ යුතු වුවද එසේ පරීක්ෂාවකින් තොරව ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සමිති තෝරා ගෙන තිබුණි. | ඉදිරියේදී නිසි පරිදි කටයුතු කරන බව | ව්‍යාපෘති අධීක්ෂණය හා සැලැසුම් කිරීම මනාව සිදු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන කටයුතු අවස්ථා 10 කදී රු.952,875 ක මූල්‍ය වටිනාකමක් සඳහා සභාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා සත්‍ය වශයෙන් සිටින සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 05 ක පුරප්පාඩු 10 ක් පවතින බව අනාවරණය විය. | මෙම සේවක පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ බලධාරින් වෙත වරින් වර ඉල්ලීම් සිදුකළ ද මේ වන තෙක් ඊට සාධාරණ විසඳුමක් ලැබී නොමැති බව | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් භාණ්ඩාගාර PT/18/2022 2022 දෙසැම්බර් 15 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව හා 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අංක 168 අනුව ඉකුත් වර්ෂය සඳහා වූ ගිණුම් සාරාංශයේ විස්තර හා ගෙවීම් වවුචර් හා වර්ගීකරණ ප්‍රකාශ සමඟ එක් එක් වර්ෂයේ ගිණුම් ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම | නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

බලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2024 අප්‍රේල් 22 වන දින දීය.

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණනයන් ස්ථාපනය කර තිබූ නමුත් පවතින සේවක පුරප්පාඩු අනුව එක නිලධාරියෙකු පූර්ණ කාලීනව එම කටයුතු සඳහා මුදා හැරීමට නොහැකි වීම මත අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු පැවතුණි. | අභ්‍යන්තර විගණනය ස්වාධීන කරන බව | අභ්‍යන්තර විගණනය විධිමත් කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 07ක සිට සියයට 61 ක් දක්වාද, වියදම් විෂයන් 04 ක සියයට 26 ක සිට සියයට 89 ක් දක්වාද විචලනයක් පැවතුණි. | නිසි පාලනයකින් කටයුතු කරන බව | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

## 4.4 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ ඇතුළත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා අදාළ නිර්ණායක 05 ක් හඳුනාගෙන තිබූ අතර ඉන් 03 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. එම ඉලක්කවල ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා මූලික ක්‍රියාකාරී නිර්ණායක (KPI) හා ඒවායේ තත්‍ය ක්‍රියාකාරිත්වය වාර්තා කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන එම ඉලක්ක ගත අරමුණු ඉටුකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක තීරණය කර ඒවා ලේඛනගත කළ යුතුය. ඒ අනුව ක්‍රියාකාරිත්වය වාර්තා කළ යුතුය. |